

# හිත කරදරෙන් නම් ප්‍රශ්නයක පැටලිලා නම් උදව් ඉල්ලන්න

හිතට කරදරයක් ඇතිවුන වෙලාවක, විසඳගන්න අමාරු ප්‍රශ්නයක පැටලුන වේලාවක විශ්වාසවන්ත යාළුවෙක්ගෙන් වැඩිහිටියෙක්ගෙන් උදව්වක් ඉල්ලන එක හොඳ දෙයක්

ජීවිතේ මුහුණදෙන අභියෝග හා පීඩාකාරී තත්වයන්ට හැමෝටම එකවගේ මුහුණ දෙන්න අපහසුයි. කෙනෙක් ඊට සාර්ථකව මුහුණ දෙද්දී තව කෙනෙක් අසාර්ථක වන්නට පුළුවන්

උදව් ලබාගන්න සුදුසු කෙනෙක් හොයගන්නේ කොහොමද?

ඔබට සමීප
ඔබට විශ්වාසය තැබිය හැකි
ඔබේ පෞද්ගලිකත්වය සුරකින
ජීවිතය හා සමාජය ගැන අත්දැකීම් ඇති අයෙකු නම් වඩා හොඳයි.

එසේ තමන්ට පෞද්ගලිකව විශ්වාසය තැබිය හැකි අයෙකු නැතිනම්,
වෘත්තීමය සහායක් හෝ යම් ආයතනයක සහාය ලබා ගැනමට යොමු වන්න පුළුවන්

එසේ උදව් ඉල්ලීමට කිසි විටෙක මැලි නොවන්න, ලැජ්ජා නොවන්න. ඔබ වැඩි වශයෙන් අපහසුතාවට පත්වන්නේ උදව් ඉල්ලීමට යාම නිසා නොව ප්‍රශ්න හා ගැටළු හිතේ තද කරගෙන සිටින විටය.